# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 1989/29 - 2016 ඔක්තෝබර් මස 19 වැනි බදාදා - 2016.10.19**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57 (1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පැවරීම

01. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57(1) වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව, මෙහි "අ" උපලේඛනයේ I තීරුවෙහි දක්වා ඇති නිලධර බණ්ඩයන් සම්බන්ධයෙන් වූ III තීරුවෙහි දක්වා ඇති බලතල, II තීරුවෙහි දක්වා ඇති රජයේ නිලධාරීන් වෙත රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් මෙයින් පවරා දෙනු ලැබේ.

02. එසේ වුවද, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදුකරන ලද යම් බලතල පැවරීමකට අයත් විෂය පථය සම්බන්ධයෙන් හෝ එකී කොමිෂන් සභාව විසින් එලෙස සිදුකරන ලද යම් බලතල පැවරීමක් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් හෝ ඇතිවිය හැකි අවිනිශ්චිත තත්වයකදී රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක විය යුත්තේය.

03. තවද, මෙහි උපලේඛනයන්හි II තීරුවේ සඳහන් යම් රජයේ නිලධරයෙකු එකී උපලේඛනයේ I තීරුවෙහි සඳහන් අනුරූපී විෂයාංකයෙහි දැක්වෙන කිසියම් බණ්ඩයකට අයත් නිලධරයෙකු සම්බන්ධයෙන් පැවැත්වෙන යම් විනය පරීක්ෂණයකදී පැමිණිලිකරුවෙකු හෝ සාක්ෂිකරුවෙකු හෝ විභව්‍ය සාක්ෂිකරුවෙකු හෝ වන්නේ නම්, එම නිලධරයා සම්බන්ධයෙන් පවරනු ලැබ ඇති බලතල ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබ ඇතැයි සැලකිය යුතු වන අතර, රාජ්‍ය සේවා කොමිෂන් සභාව එකී නිලධරයා සම්බන්ධයෙන් එලෙස පවරනු ලැබ ඇති බලතල, එකී නිලධරයා සම්බන්ධයෙන් කිසිදු බලතල පැවරීමක් සිදු කර නොමැති සේ සලකා ක්‍රියාත්මක කළ යුතු වන්නේය.

04. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57 (1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව බලතල පවරන ලද, අංක 1955/22 හා 2016.02.25 දිනැති *අති විශේෂ ගැසට් නිවේදනය* මගින් සංශෝධිත, අංක 1941/41 හා 2015.11.20 දිනැති *අති විශේෂ ගැසට් නිවේදනයෙහි* පළ කරනු ලැබ ඇති උපලේඛනයෙහි I කොටසෙහි බලතල පැවරීමට අදාළ අධ්‍යාපන විෂය සම්බන්ධ විධිවිධාන, පූර්වෝක්ත ගැසට් පත්‍ර වල පල කරන ලද බලතල පැවරීම යටතේ ගන්න ලද හෝ ගනු ලබනු ඇති සැලකෙන යම් ක්‍රියාමාර්ගයකට අගතියක් නොවන පරිදි මෙයින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබේ.

"අ" උපලේඛනය

| I තීරුව<br>නිලධාරී ගණය | II තීරුව<br>බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන් | III තීරුව<br>පවරන ලද බලතල |
|---|---|---|
| 1. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I වන ශ්‍රේණියට අයත් හා ඊට ඉහළ නිලධරයන් | අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශ ලේකම් | I. ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ දෙවන උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය. |
| 2. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I වන ශ්‍රේණියට පහළ නිලධරයන් | අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශ ලේකම් /අමාත්‍යාංශ ලේකම් විසින් නම් කරනු ලැබ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන අතිරේක ලේකම්වරයකු | I. ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ දෙවන උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය. |
| 3. අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ අධ්‍යාපන විෂය යටතට ගැනෙන, දීප ව්‍යාප්ත සේවාවකට අයත් නොවන, අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (II ඇමුණුම) හි අර්ථ නිරූපණය කර ඇති ජ්‍යෙෂ්ඨ මට්ටමේ I වන ශ්‍රේණියේ හා ඊට ඉහළ නිලධරයන්<br>(ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයට අයත් නිලධරයන්ද ඇතුළුව) | අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශ ලේකම් | I. ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ දෙවන උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය. |
| 4. අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ අධ්‍යාපන විෂය යටතට ගැනෙන, දීප ව්‍යාප්ත සේවාවකට අයත් නොවන අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (II ඇමුණුම) හි අර්ථ නිරූපණය කර ඇති ජ්‍යෙෂ්ඨ මට්ටමේ I වන ශ්‍රේණියට පහළ නිලධරයන්<br>(ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයට අයත් නිලධාරින්ද ඇතුළුව) | අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශ ලේකම් /අමාත්‍යාංශ ලේකම් විසින් නම් කරනු ලැබ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන අතිරේක ලේකම්වරයකු | I. ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ දෙවන උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය. |
| 5. ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධරයන් | අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් /අමාත්‍යාංශ ලේකම් විසින් නම් කරනු ලැබ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන අතිරේක ලේකම්වරයකු | I. ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ දෙවන උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය. |
| 6. අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය යටතට ගැනෙන ශ්‍රී ලංකා ගුරු සේවයේ ගුරුවරුන් | අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් /අමාත්‍යාංශ ලේකම් විසින් නම් කරනු ලැබ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන අතිරේක ලේකම්වරයකු | I. ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ දෙවන උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය. |
| 7. අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ අධ්‍යාපන විෂය යටතට ගැනෙන, අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (II ඇමුණුම) හි අර්ථ නිරූපණය කර ඇති තෘතීයික මට්ටමේ අධි ශ්‍රේණියේ/විශේෂ ශ්‍රේණියේ නිලධරයන් | අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශ ලේකම් /අමාත්‍යාංශ ලේකම් විසින් නම් කරනු ලැබ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන අතිරේක ලේකම්වරයකු | I. ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ දෙවන උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය. |

"අ" උපලේඛනය *(සම්බන්ධිතයි)*

| I තීරුව<br>*නිලධාරී ගණය* | II තීරුව<br>*බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන්* | III තීරුව<br>*පවරන ලද බලතල* |
|---|---|---|
| 8. අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ අධ්‍යාපන විෂය යටතට ගැනෙන, ඒකාබද්ධ සේවයට අයත් නොවන අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (II ඇමුණුම) හි අර්ථ නිරූපණය කර ඇති ද්විතීයික හා තෘතීයික මට්ටමේ නිලධරයන් | අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් /අමාත්‍යාංශ ලේකම් විසින් නම් කරනු ලැබ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන අතිරේක ලේකම්වරයකු | I. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පරිපාටිය අනුව වාර්ෂික ස්ථාන මාරු කිරීම ඇතුළු සියලුම ස්ථාන මාරු කිරීම<br>II. ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ දෙවන උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය |
| 9. අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ අධ්‍යාපන විෂය යටතට ගැනෙන, ඒකාබද්ධ සේවයට අයත් නොවන අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (II ඇමුණුම) හි අර්ථ නිරූපණය කර ඇති ප්‍රාථමික මට්ටමේ නිලධරයන් | අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් | I. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ සේවා ව්‍යවස්ථාව/ බඳවා ගැනීමේ පරිපාටිය අනුව පත්කිරීම හා උසස් කිරීම<br>II. ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ පළමු උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය හා සේවයෙන් පහ කිරීම |
| | අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් /අමාත්‍යාංශ ලේකම් විසින් නම් කරනු ලැබ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන අතිරේක ලේකම්වරයකු | I. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පරිපාටිය අනුව වාර්ෂික ස්ථාන මාරු කිරීම ඇතුළු සියලුම ස්ථාන මාරු කිරීම<br>II. ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ දෙවන උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය |

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 56 (1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පැවරීම.

01. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 56 (1) වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව, මෙහි "ආ" උපලේඛනයේ, I තීරුවෙහි දක්වා ඇති නිලධර බණ්ඩයන් සම්බන්ධයෙන්වූ II තීරුවෙහි දක්වා ඇති බලතල, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන අධ්‍යාපන සේවා කමිටුව වෙත රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් මෙයින් පවරා දෙනු ලැබේ.

02. එසේ වුවද, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදුකරන ලද යම් බලතල පැවරීමකට අයත් විෂය පථය සම්බන්ධයෙන් හෝ එකී කොමිෂන් සභාව විසින් එලෙස සිදුකරන ලද යම් බලතල පැවරීමක් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් හෝ ඇතිවිය හැකි අවිනිශ්චිත තත්වයකදී රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක විය යුත්තේය.

**03. මෙම බලතල පැවරීම ක්‍රියාත්මක වන දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් ඉදිරියේ කටයුතු කෙරෙමින් පවත්නා අධ්‍යාපන සේවා කමිටුව වෙත පවරන ලද බලතල වලට අදාළ සියලුම කරුණු, මෙම බලතල පැවරීම ක්‍රියාත්මක වන දින සිට අධ්‍යාපන සේවා කමිටුව වෙත පවරා දෙනු ලැබේ.**

"ආ" උපලේඛනය

| I තීරුව<br>නිලධාරී ගණය | II තීරුව<br>පවරන ලද බලතල |
|---|---|
| 1. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට අයත් නිලධරයන් | I. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ සේවා ව්‍යවස්ථාව අනුව පත්කිරීම, උසස් කිරීම<br>II. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පරිපාටිය අනුව වාර්ෂික ස්ථාන මාරු කිරීම ඇතුළු සියලුම ස්ථාන මාරු කිරීම<br>III. ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ පළමු උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය හා සේවයෙන් පහ කිරීම |
| 2. අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ අධ්‍යාපන විෂය යටතට ගැනෙන, දීප ව්‍යාප්ත සේවාවකට අයත් නොවන අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (II ඇමුණුම) හි අර්ථ නිරූපණය කර ඇති ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධරයන්<br>(ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයට අයත් නිලධරයන්ද ඇතුළුව) | I. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ සේවා ව්‍යවස්ථාව බඳවා ගැනීමේ පරිපාටිය අනුව පත්කිරීම, උසස් කිරීම<br>II. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පරිපාටිය අනුව වාර්ෂික ස්ථාන මාරු කිරීම ඇතුළු සියලුම ස්ථාන මාරු කිරීම<br>III. ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ පළමු උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය හා සේවයෙන් පහ කිරීම |
| 3. ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධරයන් | I. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ සේවා ව්‍යවස්ථාව බඳවා ගැනීමේ පරිපාටිය අනුව පත්කිරීම, උසස් කිරීම<br>II. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පරිපාටිය අනුව වාර්ෂික ස්ථාන මාරු කිරීම ඇතුළු සියලුම ස්ථාන මාරු කිරීම<br>III. ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ පළමු උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය හා සේවයෙන් පහ කිරීම |
| 4. අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය යටතට ගැනෙන, ශ්‍රී ලංකා ගුරු සේවයේ ගුරුවරුන් | I. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ සේවා ව්‍යවස්ථාව බඳවා ගැනීමේ පරිපාටිය අනුව පත්කිරීම, උසස් කිරීම<br>II. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පරිපාටිය අනුව වාර්ෂික ස්ථාන මාරු කිරීම ඇතුළු සියලුම ස්ථාන මාරු කිරීම<br>III. ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ පළමු උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය හා සේවයෙන් පහ කිරීම |
| 5. අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය යටතට ගැනෙන පහත සඳහන් ගණයන්ට අයත් නිලධරයන්:<br>(a) ජාතික පාසැල්වල විදුහල්පතිවරුන්<br>(b) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ හෝ ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ I වන ශ්‍රේණියේ හා ඊට ඉහළ ශ්‍රේණිවල නිලධරයන් (දෙපාර්තමේන්තු ප්‍රධානීන් හැර) | I. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ සේවා ව්‍යවස්ථාව/ බඳවා ගැනීමේ පරිපාටිය අනුව තනතුරු වලට පත් කිරීම හා එම තනතුරු වලින් ස්ථාන මාරු කිරීම |

"ආ" උපලේඛනය *(සම්බන්ධිතයි)*

| I තීරුව<br>නිලධාරී ගණය | II තීරුව<br>පවරන ලද බලතල |
|---|---|
| 6. අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ අධ්‍යාපන විෂය යටතට ගැනෙන, අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (II ඇමුණුම) හි අර්ථ නිරූපණය කර ඇති තෘතීයික මට්ටමේ අධි ශ්‍රේණියේ/ විශේෂ ශ්‍රේණියේ නිලධරයන් | I. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ සේවා ව්‍යවස්ථාව බඳවා ගැනීමේ පරිපාටිය අනුව පත්කිරීම, උසස් කිරීම<br>II. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පරිපාටිය අනුව වාර්ෂික ස්ථාන මාරු කිරීම ඇතුළු සියලුම ස්ථාන මාරු කිරීම<br>III. ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ පළමු උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය හා සේවයෙන් පහ කිරීම |
| 7. අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ අධ්‍යාපන විෂය යටතට ගැනෙන, ඒකාබද්ධ සේවයට අයත් නොවන අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (II ඇමුණුම) හි අර්ථ නිරූපණය කර ඇති ද්විතීයික හා තෘතීයික මට්ටමේ නිලධරයන් | I. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ සේවා ව්‍යවස්ථාව/ බඳවා ගැනීමේ පරිපාටිය අනුව පත්කිරීම හා උසස් කිරීම<br>II. ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ පළමු උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය හා සේවයෙන් පහ කිරීම |

මෙම බලතල පැවරීම මෙහි අඩංගු වී ඇති අයුරින් දෙදහස් දහසයේ (2016) ඔක්තෝබර් මස 20 වන දින සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක විය යුතු වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එච්. එම්. ගාමිණී සෙනෙවිරත්න,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2016 ඔක්තෝබර් මස 18 වන දින දීය,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
177, නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ 05.

11 - 134

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.